# නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
# වාර්ෂික වාර්තාව
# 2012

USDA

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා,
නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. | හැඳින්වීම | 01 |
| 2. | දැක්ම | 02 |
| 3. | මෙහෙවර | 03 |
| 4. | සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය | 04 |
| 5. | ප්‍රධාන නිලධාරි මණ්ඩලය | 05 |
| 6. | සංවිධාන ව්‍යුහය | 06 |
| 7. | සභාපතිතුමාගේ සමාලෝචනය | 07 - 08 |
| 8. | ක්‍රියාත්මක වැඩසටහන් | 09 - 27 |
| 9. | මූල්‍ය ප්‍රකාශන | 28 - 30 |
| | 9.1 ශේෂ පත්‍රය | |
| | 9.2 ආදායම් සහ වියදම් ගිණුම | |
| | 9.3 ශේෂ පිරික්සුම | |
| 10. | රජයේ විගණකාධිපති වාර්ථාව | 31 - 38 |
| 10.1 | අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව | 38 - I |
| 10.2 | විගණන කමිටුවේ වාර්තාව | 38 - II |

# හැඳින්වීම

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවන ලද්දේ

2008 අංක 36 දරණ

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

පනත මඟිනි.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණ වූයේ නාගරික ජනාවාස සංවර්ධනයට අදාල ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම, තිරසර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇතිවනු පිණිස අඩු පහසුකම් නාගරික ජනාවාසවල වෙසෙන ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම සහ එම ජනතාවට අවම නාගරික පහසුකම් සඳහා ප්‍රවේශය සලස්වමින් දැනට පවතින නිවාස ඒකක වැඩිදියුණු කිරීම හෝ වඩාත් යහපත් නිවාස පහසුකම් ලබාදීම සඳහා වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම සඳහාත්ය.

# දැක්ම

"තිරසර නාගරික ජනාවාස තුළ උසස් ජීවන රටාවක් සහතික කිරීම........."



# මෙහෙවර

"සාකල්‍ය නාගරික සංවර්ධන සැලැස්මකට අනුගතව

උගණ පහසුකම් සහිත නාගරික ජනාවාස වල සහ

නාගරික කලාපවල වැසියන්ගේ

නිවාස ගැටළුවට විසඳුම් ලබාදීම හා

ඒ හා සමගාමීව

ඔවුන් සමාජ, ආර්ථික හා සංස්කෘතික වශයෙන්

සවිබල ගැන්වීම"

# 2012

**2012.01.01සිට 2012.12.31 දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය**

| අ/අ | තනතුර | නම | පත්වූ දිනය |
|---|---|---|---|
| 1 | සභාපති | නීතිඥ පාලිත ගමගේ මහතා | 2010.05.24 |
| 2 | අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්) | වෛද්‍ය සුමිත් වන්නිආරච්චි මහතා | 2010.05.26 |
| 3 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | පූජ්‍ය ඉත්තෑකන්දේ සද්ධාතිස්ස හිමි | 2010.05.24 |
| 4 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඩබ්.එම්.පී.පී. වික්‍රමසිංහ මහතා | 2012.01.05 |
| 5 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | නිමල් පෙරේරා මහතා | 2012.01.05 |
| 6 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඒ.ඩබ්.දයානන්ද මහතා | 2010.07.07 |
| 7 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | එම්.අයි.වී.අමරසේකර මෙනෙවිය | 2010.07.28 |
| 8 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | බර්නාඩ් කාරියවසම් මහතා | 2010.05.24 |
| 9 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | රනිල් ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා | 2010.05.24 |
| 10 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා | 2010.05.24 |
| 11 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | චමින්ද කුමාර සුදසිංහ මහතා | 2010.05.24 |
| 12 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අජිත් කිත්සිරි බණ්ඩාර මහතා | 2010.05.24 |

# 2012

## 2012.01.01 වන දින සිට 2012.12.31වන දින දක්වා ප්‍රධාන නිලධාරි මණ්ඩලය

| අ/අ | තනතුර | නම | අධිකාරියට පත්වූ දිනය |
|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | වෛද්‍ය සුමිත් වන්නිආරච්චි මහතා | 2010.05.26 |
| 2 | අධ්‍යක්ෂ (සමාජ සජීවීකරණ) | වයි.ආර්. ද සිල්වා මහතා | 2011.11.01 |
| 3 | (වැ.බ)අධ්‍යක්ෂ (මුදල්) | එන්.ජී.පී. ඩයස් මහතා | 2011.02.01 |
| 4 | අධ්‍යක්ෂ :සැලසුම් හා ක.තො.ප) | එම්.ඩී.කේ.චන්ද්‍රසේන මහතා | 2011.02.01 |
| 5 | ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | ජී. ජේ.ගුණසේකර මහතා | 2011.11.01 |
| 6 | (වැ.බ) අභ්‍යන්තර විගණක | එල්.ආර්.ඒ.ශාන්ත මහතා | 2011.02.01 |
| 7 | සහකාර අධ්‍යක්ෂ (නීති) | ඩී. ඒ. දේවිකා දිසානායක මහත්මිය | 2011.11.01 |
| 8 | සහකාර අධ්‍යක්ෂ (සමාජ සජීවීකරණ) | පී.එස්.ගමගේ මෙනෙවිය | 2011.11.01 |
| 9 | සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන) | කේ.කේ.ඩබ්.ටී.පී. ද සිල්වා මහත්මිය | 2011.11.01 |
| 10 | සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | ඩබ්.එම්. එල්. බොතේජු මහතා | 2012.04.03 |
| 11 | සහකාර අධ්‍යක්ෂ (මුදල්) | ඒ.එම්.කේ. බණ්ඩාර අතාවුද මහතා | 2012.06.11 |
| 12 | සහකාර අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) | එම්.එස්.වී. විපුලගුණ මහත්මිය | 2012.08.08 |
| 13 | පරිපාලන නිලධාරි | ඒ.පී.ආර්. ඥානප්‍රිය මහතා | 2012.03.22 |

# 2012 සංවිධාන ව්‍යුහය



# සභාපතිතුමාගේ සමාලෝචනය

**2012 වර්ෂය නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ආරම්භ කර ක්‍රියාත්මක වූ සිව්වන වසරයි.**

මෙම වර්ෂයේදී ජනසෙවණ සහස්‍රලංකා නිවාස සංවර්ධන වැඩසටහනට අදාලව මොරටුව නාගරික කලාපයේ මුහුදු ඛාදනයෙන් අවතැන් වූ පවුල් සහ අඩු ආදායම්ලාභී නාගරික ප්‍රජාව සඳහා ක්‍රියාත්මක නිවාස 288 කින් සමන්විත මහල් නිවාස සංකීර්ණයේ දෙවන අදියර ආරම්භ කිරීම සිදුවිය. මෙම නිවාස ව්‍යාපෘතියේ පළමු අදියරේ ඉදිකිරීම් 82% කින් නිම කිරීමට මෙන්ම දෙවන අදියර ආරම්භ කර ඉදිකිරීම්වලින් 42% ක් වැඩ නිම කිරීමට හැකි විය.

මොරටුව නාගරික කලාපයේ ප්‍රජාව ඉලක්ක කරගනිමින් ලුනාව ප්‍රදේශයේ නිවාස 356 කින් සමන්විත මහල් නිවාස පද්ධතියක් ආරම්භ කළ අතර එම නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 10% ක් පමණ නිම කිරීමට හැකි විය.

නාගරික කලාපවල පවතින තාවකාලික සහ අර්ධ නිමි නිවාස ප්‍රමිතිගත නිවාස බවට පත් කිරීම සඳහා නාගරික දිරිය නිවාස ව්‍යාපෘතිය මෙම වර්ෂය තුළදී නව වැඩසටහනක් ලෙස ආරම්භ කිරීමට හැකි විය. මේ යටතේ මුල් අදියරේ ප්‍රතිලාභීන් 252 ක් තෝරාගෙන වැඩසටහන දියත් කළ හැකි විය.

අනුරාධපුර නාගරික කලාපයේ ගංවතුර සහ වෙනත් ස්වභාවික ආපදාවන්ට ලක්වන පවුල් ඉලක්කකර ගනිමින් දැයට කිරුළ සංවර්ධන වැඩසටහනට සමගාමීව ආරම්භ කරන ලද නිවාස 108 කින් සමන්විත "තුරුඉතුරුගම" නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් නිම කිරීමට මෙම වර්ෂයේදී හැකි විය.

අඩු පහසුකම් නාගරික ජනාවාස වැසියන්ගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා ආරම්භ කර ඇති "ජනසෙවණ ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන කොළඹ නාගරික කලාපයේ උතුරු කොළඹ, මැද කොළඹ, නැගෙනහිර-බටහිර කොළඹ සහ බොරැල්ල වශයෙන් නාගරික කලාප 04 ක පුළුල් ලෙස මෙම වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට හැකිවිය. ස්වශක්ති වැඩසටහනට කොළඹ නාගරික ජනාවාස 88 ක පවුල් 12,621 ක් සම්බන්ධ වූ අතර ප්‍රජා මූල සංවිධාන 71 ක් ශක්තිමත් කිරීමද සිදුවිය. එමෙන්ම ජනාවාස දරු දැරියන් 4,546 ක් සම්බන්ධකර ගනිමින් ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව හා ඒකාබද්ධ වී ළමා ඉතුරුම් ගිණුම් 2,136 ක් ආරම්භ කිරීමද සිදුවිය.

කුඩා පරිමාණ ස්වයං රැකියාලාභීනාගරික ජනාවාස කාන්තාවන් දිරිමත් කිරීම උදෙසා කුඩා පරිමාණ ස්වයං රැකියාවන්හි නිරත කාන්තාවන් 142 ක් සඳහා ණය ආධාර ලබාදීම ද සිදුවිය.

නාගරික ජනාවාස ප්‍රජාවගේ සෞඛ්‍ය හා පෝෂණ තත්වය නංවාලීම සඳහා සම්පත් දායක ආයතන සම්බන්ධකර ගනිමින් ඒ පිළිබඳ පවුල් 2,000 කට ආසන්න ප්‍රමාණයක් දැනුවත් කිරීමද ජනාවාසවල

ජීවත්වන ප්‍රජාවගේ මූලික සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම උදෙසා ප්‍රජා සහභාගිත්ව කොන්ත්‍රාත් ක්‍රමවේදය යොදා ගනිමින් ප්‍රජා ව්‍යාපෘති 22 ක් ආරම්භ කර එම ව්‍යාපෘති වලින් 65% ක් වැඩ නිමවා ජනතා අයිතියට පත්කිරීමටද මෙම වර්ෂයේදී හැකි විය.

2012 ලෝක ජනාවාස දිනය මුල්කරගෙන කොළඹ නගරයේ නාගරික ජනාවාස ආශ්‍රිතව වැඩසටහන් බොහොමයක් ක්‍රියාත්මක වූ අතර, මෙම වැඩසටහන් සඳහා අඩු පහසුකම් නාගරික ජනාවාස දරුවන් 3,500 ක් පමණ සක්‍රීයව සහභාගී වු අතර මෙම ජනාවාසවල කාන්තාවන් හා තරුණයින් 3,000 ක් පමණ ෂ්‍රීජනසෙවණ ස්වශක්ති෴ මානව සංවර්ධන වැඩසටහන සමග ක්‍රියාකාරීව සම්බන්ධ වීම සිදුවිය. මෙම වැඩසටහන් එම ජනතාව අතර ආකල්පමය වෙනසක් ඇති කිරීමට සහ පවතින සංවර්ධන කටයුතු පිළිබඳ අවබෝධයක් හා විශ්වාසයක් ගොඩනැගීමට හේතු විය.

ඒ අනුව මෙම වර්ෂයේ ආරම්භ කළ වැඩසටහන් ඉදිරියට ගෙන යාමද නව වැඩසටහන් ආරම්භ කිරීමට හැකිවීමද සතුටට කරුණකි. කෙසේ නමුත් මෙම අධිකාරියට ආරම්භක ප්‍රාග්ධනයක් ගොඩනගා ගැනීමට නොහැකි වීම විශාල අඩුපාඩුවක් වශයෙන් පෙන්වාදිය හැකිය.

නීතිඥ පාලිත ගමගේ
සභාපති
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

# ක්‍රියාත්මක වැඩසටහන් - 2012

2012 වර්ෂයේදී නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් පහත සඳහන් ආකාරයට සංවර්ධන වැඩසටහන් 04 ක් ක්‍රියාත්මක කර ඇත.

1. "ජනසෙවණ සහසුලංකා" නාගරික නිවාස වැඩසටහන
    - 1.1 අඟුලාන මහල් නිවාස ව්‍යාපෘතිය
    - 1.2 ලුනාව මහල් නිවාස ව්‍යාපෘතිය
2. "ජනසෙවණ දිරිය" නාගරික නිවාස වැඩසටහන
3. "ජනසෙවණ ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන
4. දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන

## 01. "ජනසෙවණ සහසුලංකා" නාගරික නිවාස වැඩසටහන

මහින්ද චින්තන ඉදිරි දැක්ම ජාතික සංවර්ධන ප්‍රතිපත්තීන්ට අනුව නිවාස අහිමි සැමට නිවසක හිමිකාරිත්වය ලබාදීම සඳහා රජයේ පූර්ණ මැදිහත් වීමෙන් ජනසෙවණ ජාතික නිවාස හා ජනාවාස සංවර්ධන මෙහෙයුම ක්‍රියාත්මක වේ.

කොළඹ ඇතුලු දිවයිනේ නාගරික ප්‍රදේශවල ඌණ පහසුකම් ජනාවාසයන්හි ජීවත්වන ජනතාව සඳහා විධිමත් නිවාස පහසුකම් ලබා දීම සඳහා ,ජනසෙවණ සහසුලංකා, නාගරික නිවාස වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම ප්‍රවේශය මඟින් ඌණ පහසුකම් ජනාවාසවල ජනතාවට පහසුකම් වලින් යුත් නිවාස ඒකකයක අයිතිය ලබා-දෙන අතරම, හැකි අවස්ථා වලදී වටිනා නාගරික ඉඩම් ප්‍රතිසංවර්ධන කටයුතු සඳහා නිදහස් කරනු ලැබේ.

මේ යටතේ මොරටුව නාගරික කලාපයේ නිවාස සංවර්ධන යෝජනාක්‍රම දෙකක් ආරම්භකොට ක්‍රියාත්මක කරනු ලබේ.

## 1.1 මොරටුව අගුලාන මහල් නිවාස ව්‍යාපෘතිය (අදියර I සහ II)



මොරටුව නාගරික කලාපයේ අගුලාන මුහුදු ඛාදනයට ලක්වන වෙරළ තීරයේ ජීවත්වන දිළිඳු ප්‍රජාව ඉලක්ක කරගනිමින් අගුලාන මහල් නිවාස සංකීර්ණය ආරම්භ කරන ලදී. මෙම මහල් නිවාස සංකීර්ණයේ නිවාස ඒකක 288ක් ඉදිකෙරෙන අතර නිවාසඒකකයක ප්‍රමාණය ව.අ 531 ක් වේ.



එක් නිවාස ඒකකයක් විසිත්ත කාමරය සමඟ කෑම කාමරය, නිදන කාමර දෙකක්, මුළුතැන්ගෙය, බැල්කනිය, වැසිකිළිය සහ නාන කාමරය යන අංගවලින් සමන්විත වේ. අනෙකුත් පොදු පහසුකම්ද සැපයේ.

අදියර දෙකකින් ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් නිමවෙමින් පවතින අතර වර්ෂ 2013 දෙසැම්බර් මස අවසානයේ නිම කිරීමට නියමිතය.ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මි 920 කි.



## 1.2 මොරටුව අඟුලාන මහල් නිවාස ව්‍යාපෘතිය (අදියර I සහ II)



අඩු ආදායම්ලාභී නාගරික ප්‍රජාව ඉලක්ක කර මොරටුව ලුනාව නාගරික නිවාස ව්‍යාපෘතිය වර්ෂ 2012 ජුනි මස 28 වන දින ආරම්භ කරන ලදි. මෙය නිවාස ඒකක 356 කින් සමන්විත මහල් නිවාස පද්ධතියක් වන අතර මෙම නිවාස ව්‍යාපෘතිය සඳහාඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 875 කි.(වැට් රහිතව)



මෙම මහල් නිවාස ඒකකයක ප්‍රමාණය ව.අ. 456 ක් වන අතර එක් නිවාස ඒකකයක් විසිත්ත කාමරය සමඟ කෑම කාමරය, නිදන කාමර දෙකක්, මුළුතැන්ගෙය, බැල්කනිය, වැසිකිළිය සහ නාන කාමරය යන අංගවලින් සමන්විත වේ. අනෙකුත් පොදු පහසුකම්ද සැපයේ.

මෙම ව්‍යාපෘතිය 2012 වර්ෂය තුල 10% ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත.





## 2. "ජනසෙවණ දිරිය" නාගරික නිවාස වැඩසටහන

නාගරික කලාපවල පවතින තාවකාලික හා අර්ධ නිමි නිවාස ප්‍රමිතිගත නිවාස බවට පත් කිරීම සඳහා බැංකු මූල්‍ය පද්ධතීන්ගෙන් නිවාස ණය හෝ මූල්‍ය පහසුකම් ලබාගැනීමට නොහැකි දිළිඳු ප්‍රජාවගේ නිවාස ගැටළුවට සහභාගීත්ව ක්‍රමවේදයක් මත විසඳීමේ අරමුණ සහිතව මෙම වැඩසටහන හඳුන්වාදෙන ලදි.

මේ සඳහා අඩු ආදායම්ලාභී ප්‍රතිලාභීන් හඳුනාගැනීම කලාපයේ ග්‍රාම සේවා නිළධාරී හා ප්‍රාදේශිය ලේකම් මඟින් සිදුකෙරෙන අතර ප්‍රතිලාභියා සමඟ සම්මුඛ සාකච්ඡා කොට ප්‍රතිලාභියාගේ නිවාස ඉදිකිරීමේ අවශ්‍යතාවය හා දායකත්වය ද සැළකිල්ලට ගෙන නිවාස සැලසුම් කිරීම සිදුකෙරේ. නිවාස ඉදිකිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් හා ආපසු ගෙවීමේ කාලය ප්‍රතිලාභියා සමඟ සාකච්ඡා කර තීරණය කෙරේ. ප්‍රතිලාභීන් වෙත ගොස් ඔවුන්ගේ නිවාස සංවර්ධනය කරගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා මූල්‍ය සහාය ලබාදීම මෙම වැඩසටහනේ විශේෂත්වයයි.

මෙම වැඩසටහන නියාමන ව්‍යාපෘතියක් ලෙස 2012 වර්ෂයේදී කඩුවෙල නාගරික කලාපයේ තෝරාගත් ප්‍රතිලාභීන් 252 ක් ඉලක්ක කර ගනිමින් ආරම්භ කරන ලදී. මෙහිදී ණය ආපසු ගෙවිමේ කාල සීමාව අවුරුදු10 ක් දක්වා වන අතර උපරිම ණය මුදල රු.300,000.00 කි.

නිවාස සැලසුම් හා තාක්ෂණික සහාය ප්‍රතිලාභීන් වෙත ගොස් අපගේ තාක්ෂණික නිලධාරීන් විසින් සපයනු ලැබේ.









## ප්‍රතිලාභීන් දැනුවත් කිරීම





## ප්‍රතිලාභීන් විසින් නිවාස ඉදිකිරීම් සිදු කර ඇති ආකාරය.









## 3. “ජනසෙවණ ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහන

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතමඟින් නාගරික ජනාවාස ප්‍රජාවසඳහා නිවාස සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටඅමතරව එම ජනතාවගේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය වැඩසටහන් හඳුන්වාදීමේ හා ක්‍රියාත්මක කිරීමේවගකීමදමෙම අධිකාරියට පවරා ඇත.

මෙමනාගරිකජනාවාස වැසියන්ගේ ජීවන තත්වය උසස් කර දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා “ජනසෙවණස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහන වර්ෂ 2011 දී ආරම්භ කරන ලද අතර මේ යටතේ නාගරික ජනාවාස වැසියන්ගේ ජීවන තත්වය උසස් කරලීමට අදාල විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

## ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහනේ ක්‍රියාකාරකම්

### 01. ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම

ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන පිළිබඳව පවුල් දැනුවත් කිරීම, ස්වශක්ති පවුල් ලියාපදිංචිය හා ඒ සඳහා තොරතුරු ලබා ගැනීමේ කටයුතු නව ජනාවාසයන්හි තවදුරටත් 2012 වර්ෂය තුළදී සිදුකල අතර, එහිදී ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහනේ අරමුණු සහ ක්‍රියාකාරකම් පිළිබඳව ජනාවාස ප්‍රජාව දැනුවත් කිරීම සිදු කරන ලදී.
ඒ අනුව 2012 වර්ෂයේ කොළඹ නාගරික කලාප 04ම නියෝජනය වන ලෙස ජනාවාස 88 ක පවුල් 12,621 ක් මෙම වැඩසටහන පිළිබඳව දැනුවත් කරන ලදී.

### 02. ප්‍රජා මූල සංවිධාන ශක්තිමත් කිරීම

ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන ජනාවාස වෙත ප්‍රවේශ වී ශක්තිමත් ප්‍රජා මූල සංවිධානමෙමවැඩසටහනසඳහා සම්බන්ධ කරගැනීම සහ ප්‍රජා මූල සංවිධාන අක්‍රීය ජනාවාසයන්හි ස්වශක්ති ප්‍රජා සංවර්ධන සමිති ගොඩනැගීම මඟින් ශක්තිමත් ප්‍රජා සංවිධාන ව්‍යුහයක් ජනාවාස තුළ ස්ථාපිත කිරීම සිදුකෙරේ. මේ අනුව 2012 වර්ෂයේ දී නව ප්‍රජා මූල සංවිධාන 71 ක් සම්බන්ධ කර ගනිමින් කොළඹ නගරයේ  ස්වශක්තිමානව සංවර්ධන වැඩසටහනදියත් කිරීමට හැකිවිය.





## 03. කුඩා කණ්ඩායම් වශයෙන් ජනතාව සංවිධානය කිරීම



නාගරික ජනාවාස ප්‍රජාව කුඩා කණ්ඩායම්වශයෙන්ඒකරාශී කර සාමුහික ශක්තිය ගොඩනගා ගැනීමේ ඇති වැදගත්කමපිළිබඳව ජනාවාස ප්‍රජාව දැනුවත් කිරීම, කණ්ඩායම් වශයෙන් සංවිධානය වීමට අවශ්‍ය මග පෙන්වීම හා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සංවිධානයකිරීම මෙමගින් සිදුවේ.

ඉතුරුම් සහ කුඩා පරිමාණ මුල්‍ය ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමද මෙමගින් සිදුවේ.

## 04. ළමා සංවර්ධන වැඩසටහන

නාගරික ජනාවාස දරුවන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් ස්වශක්ති ළමා සමාජ ගොඩ නගමින්ළමා වැඩසටහන් ජනාවාස තුළ ක්‍රියාත්මක කිරීම හා විවිධ ළමා තරඟ, සෞන්දර්ය කුසලතා නංවාලීමේ වැඩසටහන්, රුක්රෝපණ වැඩසටහන්, ඉතිරි කිරීම් හා ආගමික වැඩසටහන් සහ ළමා පුස්තකාල ආරම්භ කරමින් ජනාවාස දරුවන් සෑම අංශයකින්ම සංවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ.

2012 වර්ෂයේ නාගරික ජනාවාස දරුවන් වෙනුවෙන් ස්ථාපිත කරන ලද ළමා සමාජ ගණන 63 කි. ස්වශක්ති ළමා සමාජ වැඩසටහන පිළිබඳව කොළඹ නාගරික කලාප 04 ආවරණය වන පරිදි ළමුන් 2410 ක් දැනුවත් කර ස්වශක්ති ළමා වැඩසටහනට ඔවුන්ව සම්බන්ධ කර ගන්නා ලදි.







## 05. ළමා ඉතුරුම් වැඩසටහන

මෙම ජනාවාසයන්හි ප්‍රජාව රටේ පවත්නා බැංකු ප්‍රවාහයෙන් ඈත්වීම නිසා ඔවුන් තුල ඉතිරි කිරීමේ පුරුද්දක් නොමැතිවීම ඔවුන්ගේ ආර්ථිකය ගොඩනගා ගැනීමට බලපා ඇති බරපතල ගැටලුවක් ලෙස හඳුනාගත හැකි විය. මෙම තත්වය මගහරවා ගැනීම අනිවාර්යයෙන්ම කල යුතු යැයි අප හඳුනා ගත් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සඳහා වැඩසටහනක් හඳුන්වා දෙන ලදි. වැඩිහිටි හා ළමා ඉතිරි කිරීම් වැඩසටහන්මේ යටතේ වෙන් වෙන්ව ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව සමග ඒකාබද්ධවී 2012 වර්ෂයේදී ළමා ඉතුරුම් ගිණුම් 1136 ක් ආරම්භ කරන ලදී. ඒ හා සමගාමීව වැඩිහිටි ඉතුරුම් වැඩසටහනදක්‍රියාත්මක වේ.





## 06. නාගරික කෘෂි ව්‍යාපෘතිය

නාගරික ජනාවාසවල කුඩා ඉඩ ප්‍රමාණ හා අවකාශ භාවිතා කර කෘෂිකර්මාන්තයේ යෙදීමට අවශ්‍ය දැනුම හා සහාය ලබාදීමෙන් ඔවුන්ගේ එදිනෙදා වියදම් අඩු කිරීමටත් යහපත් පරිසරයක් ඇති කිරීමටත් නිවසෙහි දෛනිකව ඉවතලන අපද්‍රව්‍ය ඵලදායී භාවිතයට පෙළඹවීමත් අරමුණු කොට ගෙනනාගරික කෘෂි වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධවී කොළඹ නාගරික කලාප 04 නියෝජනය වන පරිදි දෙවන අදියර යටතේ ජනාවාස 14 ක නාගරික කෘෂිකර්මය පිළිබඳව ජනාවාස මට්ටමින් දැනුවත් කර එම කෘෂිකර්ම වැඩසටහනට, වැඩිහිටියන් හා ළමා සමාජවල ළමුන් ඒකාබද්ධ කර ගනිමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී.




## 07. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ දැනුවත් කිරීමේ වැඩසටහන.



නාගරික පරිසරය තුල බරපතල ගැටළුවක්ව පවතින අපද්‍රව්‍ය කළමනාකරණය මෙම ජනාවාසවල පදිංචි කරුවන්ගේ සහභාගිත්වයෙන් පලාත් පාලන ආයතන භාවෙනත් ආයතන දායකත්වයෙන්ආරම්භ කරන ලද්දේමෙම ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා ප්‍රජා දායකත්වය උපරිමයෙන් ලබා දීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් ලෙසය.

ඒ අනුව බස්නාහිර පළාත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සමඟ ඒකාබද්ධ දැනුවත් කිරීමේ වැඩසටහනක්ක්‍රියාත්මක කෙරිණි.

## 08. මතින් තොර නගරයක් - මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන.



මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රකාර මතින් තොර සමාජයක් බිහි කිරීම හා රටට අවශ්‍ය නිරෝගීමත් ජනතාවක් බිහිකිරීම රටේ සමාජ, සංස්කෘතික හා ආර්ථික අභිවෘද්ධියට මහත් පිටුවහලක් වේ. විශේෂයෙන් නාගරික අඩු පහසුකම් ජනාවාසවල ළමයින් සහ තරුණයින් මෙමමත් උවදුරෙන් මුදවා ගැනීමට අවශ්‍ය මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් රාජ්‍ය ආයතන, ස්වේච්ඡා සංවිධාන හා ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී.

විශේෂයෙන්ම මෙම වැඩසටහන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සමග ඒකාබද්ධවී 2011 වර්ෂයේ දී අරඹන ලදී. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, කොළඹ මහ නගර සභාව සහ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය යනාදී ආයතනද මෙම වැඩසටහන සඳහා දායකත්වය සපයන ලදි. මෙම වර්ෂයේ දිනාගරික ජනාවාස ආශ්‍රිතව දැනුවත් කිරීමේ වැඩසටහන් 58 ක් සංවිධානය කර එමගින් ප්‍රජාව දැනුවත් කරන ලදී.

## 9. වෘත්තීය පුහුණු වැඩසටහන්



නාගරිකජනාවාසයන්හි රැකියා විරහිත තරුණ තරුණියන්ව හඳුනාගත් ක්ෂේත්‍රවල වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ. නාගරික විරැකියාවට පිළියමක් ලෙස මෙමවැඩසටහන 2012 වර්ෂයේදි ක්‍රියාත්මක කරන ලදී.

## 10. ඉතුරුම් හා ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන

නාගරික ජනාවාස මට්ටමින් දැනට කුඩා පරිමාණ ස්වයං රැකියාවල නිරත ප්‍රතිලාභීන් පිළිබඳ මූලික සමීක්ෂණයක් සිදු කරන ලදී. කොළඹ නාගරික කලාප 04 නියෝජනය වන පරිදි එවැනි ප්‍රතිලාභීන් හඳුනා ගනිමින් ඔවුන් පිළිබඳව මූලික ශක්‍යතා අධ්‍යයනයක්ද සිදුකරන ලදී. එහිදී විශේෂයෙන්ම ජනාවාස මට්ටමින් ආහාර නිෂ්පාදනය, කුඩා ව්‍යාපාර, වෙනත් සේවාවන් හා කුඩා පරිමාණ නිෂ්පාදන වැඩි දියුණු කරගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් හා විධිමත් පුහුණුවීම් ලබා ගැනීමට අවශ්‍ය සහාය ලබාදෙන ලෙස එම ප්‍රතිලාභීන් ඉල්ලුම් කරන ලදී.



අධිකාරිය මැදිහත්වී එම ප්‍රතිලාභීන් කණ්ඩායම්ගත කර ඉතුරුම් සඳහා පළමුව යොමුකර ඔවුන් දැනට පවත්වාගෙන යන ස්වයං රැකියා ශක්තිමත් කිරීමට අවශ්‍ය දැනුම ලබාදීම හා ව්‍යාපාර දියුණුකර ගැනීමට අවශ්‍ය ණය පහසුකම් අවශ්‍යතාවයන් පිළිබඳව මූලික තොරතුරු ලබාගන්නා ලදී. කුඩා පරිමාණ වශයෙන් අවමය රු. 5,000.00 සිට උපරිමය රු. 15,000.00 දක්වා කුඩා ව්‍යාපාර දියුණු කර ගැනීමට ප්‍රතිලාභීන් 142 ක් සඳහා ණය පහසුකම්
ලබාදීම මෙම වර්ෂයේදී සිදුවිය.

මෙමක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහනේ ණය ආපසු ගෙවීමේ කාලය වර්ෂයකි. පොළී ප්‍රතිශතය 9% කි.



## 11. ප්‍රජා සෞඛ්‍ය හා සායන වැඩසටහන

ස්වශක්තිමානව සංවර්ධන වැඩසටහන යටතේ නාගරික අඩු පහසුකම් ජනාවාසයන්හි හඳුනාගත් තවත් එක් ගැටළුවක් වුයේසෞඛ්‍ය හා සනීපාරක්ෂාව සම්බන්ධයෙන් ජනාවාස ප්‍රජාව තුළ ප්‍රමාණවත් දැනුමත් නොමැති වීමය. මෙම ජනාවාසවල ළමුන් හා වැඩිහිටියන් මෙන්ම තරුණ පිරිස් අතර ද සෞඛ්‍ය, පෝෂණය හා සනීපාරක්ෂාව සම්බන්ධ දැනුම ද අඩු මට්ටමක පවතී. ප්‍රජාවගේ ඉල්ලීම මත ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන්, ප්‍රජා සෞඛ්‍ය සායන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්පත්දායක ආයතන සම්බන්ධකර ගනිමින් ක්‍රියාත්මක කරන ලදි.



**ළමා හා මාතෘ සායන**

**නාගරික ජනාවාස ප්‍රජාව වෙනුවෙන් අක්ෂි සායන**





**නාගරික ජනාවාස දරුවන් වෙනුවෙන් දන්ත සායන**





**නාගරික ජනාවාස ප්‍රජාව වෙනුවෙන් ආයුර්වේද සායන**





## 12. ජනසෙවණ ප්‍රජා සහභාගීත්ව පාරිසරික හා සනීපාරක්ෂක වැඩසටහන

නාගරික ජනාවාස ආශ්‍රිතව අත්‍යවශ්‍යයෙන්ම සංවර්ධනය කල යුතු පොදු පහසුකම්සංවර්ධනය කර දීම මෙමවැඩසටහනේ අරමුණයි.මෙමප්‍රජාව වෙනුවෙන් ක්‍රමවත් නිවාස පහසුකම් සපයනතෙක් මෙමජනාවාසවල පොදු වශයෙන් පවතින වැසිකිළි පහසුකම්, මළපවහන පද්ධති, ප්‍රජා ශාලා, ක්‍රීඩා විවේකාගාර හා පුස්තකාල සංවර්ධනයකර දීමමෙමවැඩසටහන යටතේ සිදු කරන ලදී. මේ යටතේ ව්‍යාපෘති 22 ක් 2012 වර්ෂයේදි ක්‍රියාත්මක කරන ලදී.

**එම ප්‍රතිසංස්කරණය කරන ලද ප්‍රජා ව්‍යාපෘති කිහිපයක් පහත දැක්වේ**

**ගෝතමීපුර ප්‍රජාශාලාව - රාජගිරිය**







**ශාන්ත අන්තෝනි සිංහල මහා විද්‍යාලය - මට්ටක්කුලිය**

**වැසි ආවරණය සැකසීම**





T20 වත්ත ප්‍රජා ශාලාව - බොරැල්ල




කදිරාන වත්ත ප්‍රජා ශාලාව - මට්ටක්කුලිය




## ලෝක ජනාවාස දිනය සැමරීම - 2012

- ලෝක ජනාවාස දිනය සැමරීම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත මඟින් මෙම අධිකාරියට පැවරී ඇත.

- ඒ අනුව ලෝක ජනාවාස  දිනය සැමරීම වෙනුවෙන් අධිකාරියේ මැදිහත්වීමෙන් ,වෙනස්වන නගරයට අවස්ථාව සලසමු, තේමාකොට ගනිමින් ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය 2012 සැප්තැම්බර් මස 24 වන දින සිට 27 වන දින දක්වා ජනාවාස සති සැමරුම් වැඩසටහනක් සංවිධානය කරන ලදි. එම සති සැමරුම් වැඩසටහනට අදාලව අප අධිකාරිය විසින් පහත සඳහන් දිනයන් වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය.

I. 2012 සැප්තැම්බර් 24 දින  ප්‍රජා දායකත්ව පරිසර දිනය
II. 2012  සැප්තැම්බර් 26 දින  ජනාවාස සංවර්ධනයට ප්‍රජා නායකත්වය
III. 2012 සැප්තැම්බර් 29 දින අනාගත සුරක්ෂිතතාවය සඳහා ඉතුරුම් ප්‍රවර්ධනය හා කලා කුසලතා ප්‍රවර්ධනය
IV. 2012 සැප්තැම්බර් 30 දින ක්‍රීඩා කුසලතා ප්‍රවර්ධනය

- **2012 සැප්තැම්බර් 24 දින ප්‍රජා දායකත්ව පරිසර දිනය**

"සෞඛ්‍ය හා සනීපාරක්ෂාව තුලින් ජන ජීවිතය සුරක්ෂිත කරමු" තේමාව කරගනිමින්  "ජනසෙවණ ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහනට සමගාමීව නාගරික ජනාවාසයන්හි ප්‍රතිසංස්කරණයට භාජනය  කල යුතු යටිතල පහසුකම් හා පොදු පහසුකම් සංවර්ධනය කිරීම මෙම වැඩසටහන යටතේ සිදු කෙරිණි.

2012 ලෝක ජනාවාස දිනය සැමරීම නිමිත්තෙන් එකී වැඩසටහන යටතේ අවම පහසුකම් සහිතනාගරික ජනාවාසයන්හි ළඳරු පාසල්, ප්‍රජා ශාලා, කාණු පද්ධති අළුත්වැඩියා කිරීම් ආදි ව්‍යාපෘතීන් ප්‍රජාව තුලින්ම හඳුනාගෙන අප අධිකාරිය සහ වෙනත් ආයතන ඒකාබද්ධව ව්‍යාපෘති 22 ක් කොළඹ නගරය තුල නාගරික ජනාවාස මට්ටමින් ක්‍රියාත්මක කරන ලද අතර මෙම වැඩසටහන යටතේ පිළිසකර කරන ලද ශ්‍රී වික්‍රමපුර ක්‍රීඩාංගනය සහ ප්‍රජා ශාලාව 2012 සැප්තැම්බර් 24 වන දින උත්සවාකාරයෙන් ජනතා අයිතියට පත් කරන ලදී.




- 2012 සැප්තැම්බර් 26 දින ජනාවාස සංවර්ධනයට ප්‍රජා නායකත්වය

"නාගරික යහ පාලනය සඳහා ප්‍රජාව බලගන්වමු" තේමා කරගනිමින් මෙම දිනය වෙන් වූ අතර, නාගරික ජනාවාසයන්හි ජීවත්වන ප්‍රජා කණ්ඩායම්වලට මෙතෙක් විසඳුම් නොලද ආර්ථික, සාමාජීය, සංස්කෘතික හා පාරිසරික ගැටළු වලට රාජ්‍ය ආයතන සහ අනෙකුත් ආයතන මඟින් විසඳුම් ලබා ගැනීමට ප්‍රජා නායකත්වය මෙහෙයවීම සහ මඟපෙන්වීම මෙම වැඩසටහන තුලින් සිදුවේ.

ජනසෙවණ ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන නාගරික ජනාවාස වෙත ප්‍රවේශ වී මෙම ගැටළු තරමක් දුරට අවබෝධකරගත් අතර එම ගැටළු හඳුනාගැනීමටත් ඒවා නිරාකරණය කර ගැනීම සඳහා ප්‍රජා නායකයන් මෙහෙයවීමටත් අවශ්‍ය මඟපෙන්වීම අප විසින් ලබා දී ඇත.

කොළඹ නගරයේ තෝරාගත් ජනාවාස 200 ක මෙවන් ප්‍රජා නායකයන් හඳුනාගෙන ඔවුන්ගේ අදහස් හා යෝජනා සැලකිල්ලට ගනිමින් ඔවුන්ගේ ප්‍රජා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීමත් සිදු කෙරිණි.

මෙවන් වූ ප්‍රජා නායකයන් ඇගයීම හා ඉදිරි වැඩසටහන් පිළිබඳ සාකච්ඡා කිරීම හා තීරණ ගැනීම උදෙසා ප්‍රජා නායකයන් 1000 ගේ සහභාගීත්වයෙන් ඇගයීමේ වැඩසටහනක් 2012 සැප්තැම්බර් මස 26 වන දින ජෝන් ද සිල්වා සමරු රඟහලේදී පැවැත්විනි.





- **2012 සැප්තැම්බර් 29 දින අනාගත සුරක්ෂිතතාවය සඳහා ඉතුරුම් ප්‍රවර්ධනය හා කලා කුසලතා ප්‍රවර්ධනය**

නාගරික ජනාවාස දරු දැරියන්ගේ අනාගත සුරක්ෂිත භාවය සඳහා ඔවුන් වඩ වඩාත් ඉතිරි කිරීම් සඳහා පෙළඹවීම අරමුණුකොට "ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහනට සමගාමීව දරු දැරියන් සඳහා වු ඉතිරි කිරීම් ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක වේ. කොළඹ නගරයේ ජනාවාස 200 ක දරු දැරියන් ඉලක්ක කොට මෙම වැඩසටහන ක්‍රියාවට නැංවූ අතර, 2012 ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් මේ සඳහා දරු දැරියන් 1000 ක් ඉලක්ක කර ගනිමින් ඉතුරුම් වැඩසටහනක් සැලසුම්කරන ලදී.

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ අනුග්‍රාහකත්වය යටතේ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ක්‍රියාවට නැංවූ මෙම නාගරික දරුවන් සඳහා වු ඉතුරුම් වැඩසටහන මඟින් 2012 සැප්තැම්බර් මස 29 වන දින විහාර මහාදේවි එළිමහන් රංග පීඨයේදීළමා ඉතුරුම් ගිණුම් 1000 ක් ආරම්භ කිරීම සිදුකෙරිණි.

- **නාගරික ජනාවාස දරුවන්ගේ ළමා සිතුවම් දැක්ම**

නාගරික ජනාවාස දරුවන්ගේ නිර්මාණාත්මක හැකියාවන් හා කලා කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් ජනාවාස දරුවන් 5000 ක් ඒකරාශි කර ගනිමින් වයස් කාණ්ඩ 03 ක් යටතේ ළමා චිත්‍ර තරඟයක් ලෝක ජනාවාස දින තේමාව මුලික කර ගනිමින් පවත්වනු ලැබීය.

පළමු වටය සඳහා ඉදිරිපත් වු ළමුන්ගෙන් වඩාත් සාර්ථක නිර්මාණ 1000 ක් තෝරා සජීවීව චිත්‍ර නිර්මාණය කිරීම 2012 සැප්තැම්බර් මස 22 වන දින විහාරමහාදේවි උද්‍යානයේදී සිදුකෙරුනු අතර එම චිත්‍ර නිර්මාණ ප්‍රදර්ශනයක් ලෙසින් ඉදිරිපත් කිරීම 2012 සැප්තැම්බර් මස 22 වන දින කොළඹ කලා භවනේදී පැවැත්විණි.

වයස් කාණ්ඩ අනුව ළමා සිතුවම් තරඟයෙන් ජයග්‍රහණය කරනු ලැබු දරුවන් වෙත තිළිණ, සහතිකපත්, සම්මාන සහ මුදල් ත්‍යාග ලබාදීම කොළඹ මහ නගර සභා පිටියේදී පැවති ලෝක ජනාවාස දින ජාතික සමුළුවේදී අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.







- **නාගරික ජනාවාස දරුවන්ගේ කුසලතා වර්ධනය උදෙසා ළමා කෙටි නාට්‍ය තරගය**

නාගරික අඩු පහසුකම් ජනාවාසවල දරුවන්ගේ ළමා නිර්මාණ හැකියාවන් වර්ධනය කිරීම සඳහා 2012 ලෝක ජනාවාස දිනය නිමිත්තෙන්ළමා නාට්‍ය තරගයක් අප අධිකාරිය විසින් සංවිධානය කරනු ලැබීය. මෙම නාට්‍ය තරගය සඳහා කොළඹ නාගරික බල ප්‍රදේශය ආවරණය වන අයුරින් නාට්‍ය 57 ක් ඉදිරිපත් විය.

නාට්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් යටතේ නාට්‍ය 15 ක් දෙවන වටය සඳහා තෝරාගනු ලැබු අතර, එම නාට්‍ය වඩාත් හොඳ නිෂ්පාදනයන් බවට පත් කිරීම අරමුණුකොට විශේෂ නාට්‍ය වැඩමුළුවක් ද සංවිධානය කරන ලදි.

දෙවන වටය සඳහා තෝරාගනු ලැබු නාට්‍ය සහභාගී කරගනිමින් නාට්‍ය උළෙලක් 2012 සැප්තැම්බර් 22 වන දින කොළඹ 07 ග්‍රීන්පාත් නව නගර ශාලාවේදී පැවැත්විණි. එම නාට්‍ය උළෙලේදී ජයග්‍රාහී නාට්‍යයන් මෙන්ම ශිල්පීන් ද තෝරාගනු ලැබූ අතර, එම ජයග්‍රහණ සඳහා වූ ත්‍යාග හා සහතිකපත් පිරිනැමීම ඔක්තෝම්බර් මස පළමුවන දින ලෝක ජනාවාස දින ජාතික සමුළුවේදී සිදු කෙරිනි. මෙයට අමතරව ප්‍රථමස්ථානය හිමිකරගත් නාට්‍යය ජනාවාස සමුළුවේදී වේදිකාගත කරන ලදි.






- **නාගරික ජනාවාස දරුවන්ගේ කුසලතා වර්ධනය උදෙසා ළමා රචනා තරගය**

2012 ලෝක ජනාවාස දිනය නිමිතිකොට පාසැල් දරු දැරියන්ගේ නිවාස හා ජනාවාසකරණය පිළිබඳ දැනුම සහ අවබෝධය වර්ධනය කිරීමේ අරමුණින් නාගරික ජනාවාස ආශ්‍රිත පාසල් ළමුන් සම්බන්ධකර ගනිමින් රචනා තරගයක් සංවිධානය කරනු ලැබීය.

එම තරඟය සඳහා නිර්මාණකරුවන් 600 ක් පමණ ඉදිරිපත් වු අතර, වයස් කාණ්ඩ 03 ක් යටතේ ජයග්‍රහණය කරන ලද දරුවන්ට තිළිණ, සහතිකපත් හා මුදල් ත්‍යාග පිරිනැමීම ලෝක ජනාවාස දින ජාතික සමුළුවේදී සිදු කෙරිණි.





■ **2012 සැප්තැම්බර් 19 ක්‍රීඩා කුසලතා ප්‍රවර්ධනය - සය සාමාජික ක්‍රිකට් තරගාවලිය**

කොළඹ නාගරික අඩු පහසුකම් ජනාවාසයන්හි දරු දැරියන් සහ තරුණ තරුණියන්ගේ ක්‍රීඩා කුසලතාවයන් වර්ධනය කිරීමේ අරමුණින් හා 2012 ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සය සාමාජික විවෘත කාන්තා සහ පිරිමි ක්‍රිකට් තරගාවලියක් සංවිධානය කරන ලදි.

මෙම තරගාවලියේ ආරම්භක වටයට කොළඹ නාගරිකය නියෝජනය කරමින් කණ්ඩායම් 127 ක් තරග වැදුනු අතර ඒ සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 1,000 කට අධික සංඛ්‍යාවක් සහභාගි විය. මෙම තරගයේ අර්ධ අවසන් පූර්ව තරග සඳහා කණ්ඩායම් 20 ක් තේරී පත්වූ අතර එම තරග 2012 සැප්තැම්බර් මස 19 වන දින කොළඹ බේස්ලයින් දුම්රිය දෙපාර්තමේන්තු ක්‍රීඩාංගනයේදී පැවැත්විණි.

මෙම තරගාවලිය තුලින් අවසන් තරගය සඳහා තේරී පත්වූ කාන්තා හා පිරිමි කණ්ඩායම් 2012 සැප්තැම්බර් 24 වන දින මට්ටක්කුලිය, ශ්‍රී වික්‍රමපුර නවීකරණය කරන ලද ක්‍රීඩාංගණය විවෘත කරන අවස්ථාවේදී තරග වැදුනු අතර ඉන් ජයග්‍රහණය හිමිකරගත් කණ්ඩායම් සඳහා ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය ඔක්තොම්බර් මස පළමු දින ලෝක ජනාවාස දින සමුළුවේදී සිදුකෙරිණි.






■ **2012 සැප්තැම්බර් 30 දින ක්‍රීඩා කුසලතා ප්‍රවර්ධනය - මැරතන් තරගය**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් අඩු පහසුකම් නාගරික ජනාවාසයන්හි වැඩිහිටියන්, තරුණ තරුණියන් සහ දරු දැරියන්ගේ සහභාගීත්වයෙන් ජනාවාස දින මැරතන් තරගයක් සංවිධානය කෙරිනි.

වයස අවුරුදු 18 ට අඩු සහ වැඩි වශයෙන් කාණ්ඩ දෙකක් යටතේ සංවිධානය වූ මෙම තරගය සඳහා අයදුම්පත් 500 කට අධික සංඛ්‍යාවක් ඉදිරිපත් වූ අතර මෙම තරගය සැප්තැම්බර් මස 30 වන දින පෙ.ව. 9.00 ට කොළඹ විහාරමහාදේවි උද්‍යානය අසලින් ආරම්භකොට නෙළුම් පොකුණ සංස්කෘතික මධ්‍යස්ථානය අසලින් අවසන් කරන ලදී.

සහභාගිවන සියළු තරගකරුවන් සඳහා සහතිකපත් සහ තරග ජයග්‍රාහකයින්ට ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය ඔක්තෝම්බර් මස පළමු දින ලෝක ජනාවාස දින සමුළුවේදී සිදුකෙරිණි.





## 4. දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන අනුරාධපුර "තුරුඉතුරුගම" නිවාස ව්‍යාපෘතිය

අනුරාධපුර දැයට කිරුල ජාතික සංවර්ධන ප්‍රදර්ශනය හා සමගාමීව 2011 වර්ෂයේ සැප්තැම්බර් මස කටුකැලියාව හරිත ජනාවාස ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. එම ව්‍යාපෘතියේ සාම්ප්‍රදායික තාක්ෂණය භාවිතයෙන් නිවාස 102 ක් හා පරිසර හා බලශක්ති හිතවාදී සුධාරක තාක්ෂණය (මැටි තාක්ෂණය) භාවිතයෙන් නිවාස 06 කින් සමන්විත නිවාස 108 ක ඉදිකිරීම් කටයුතු සිදුකළ අතර 2012 වර්ෂයේදී 95ක් ඉදිකිරීම් නිම කරන ලදී. ඒ සඳහා වැය වූ මුදල රු.මි. 74.50 කි.



## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
## 2012 දෙසැම්බර් 31 දිනට
### ශේෂ පත්‍රය

| 2011 | | සටහන් | | | |
|---|---|---|---|---|---|
| | **වත්කම්** | 1 | | | |
| | **ජංගම නොවන වත්කම්** | | | | |
| 858,377.54 | ලිබඩු හා සවිකිරීම් | | 1,553,926.26 | 938,562.37 | 615,363.89 |
| 323,903.79 | කාර්යාලීය උපකරණ | | 796,458.50 | 440,327.41 | 356,131.09 |
| | වාහන | | 22,450,000.00 | 3,694,167.00 | 18,755,833.00 |
| 654,440.58 | පරිගණක | | 4,453,658.60 | 3,219,147.60 | 1,234,511.00 |
| 1,836,721.91 | | | 29,254,043.36 | 8,292,204.38 | 20,961,838.98 |
| 50,193,090.00 | නොනිමි වැඩ අහුලාන ව්‍යාපෘතිය | | | 396,064,240.46 | |
| | නොනිමි වැඩ ලුනාව ව්‍යාපෘතිය | | | 69,912,751.29 | |
| | නොනිමි වැඩ අනුරාධපුර ව්‍යාපෘතිය | | | 86,377,355.31 | 552,354,347.06 |
| 93,681,151.29 | කොන්ත්‍රාත් අත්තිකාරම් | 2 | | | 364,394,354.79 |
| | **විසිරි නිවාස ණය** | | | | |
| | විසිරි නිවාස ණය | | | 38,016,847.00 | |
| | ලැබිය යුතු ණය වාරික | | | 537,021.18 | |
| | සමාජ සජීවිකරණ - ණය | | | 621,710.00 | 39,175,578.18 |
| | **ජංගම වත්කම්** | | | | |
| 98,860.00 | අත්තිකාරම් | 3 | | 289,645.00 | |
| 39,619,234.06 | මුදල් හා බැංකු ශේෂය | 4 | | 6,530,716.06 | |
| 11,416,004.11 | ඉතිරි කිරීමේ ගිණුම | | | 47,314,955.55 | |
| 11,482,369.04 | කාලීන තැන්පතු | | | | |
| 13,103,674.00 | රීල් සමාගම | | | 13,103,674.00 | 67,238,990.61 |
| 147,474.00 | ලැබිය යුතු පොලී | | | | |
| **221,578,578.41** | **මුළු වත්කම්** | | | | **1,044,125,109.62** |
| | **ස්කන්ධය හා වගකීම්** | | | | |
| 5,000,000,000.00 | අනුදත් ප්‍රාග්ධනය | | | | 5,000,000,000.00 |
| 228,334,000.00 | භාණ්ඩාගාර ප්‍රතිපාදන | 5 | | 835,184,000.00 | 835,184,000.00 |
| 1,694,234.46 | U.S.I.P වත්කම් | | | | |
| 21,083,577.69 | ඉ/ගේ ශේෂය (අදායම් වියදම් ගිණුම) | | | (36,193,155.21) | |
| (57,276,732.90) | අතිරික්තය/ (ඌනතාවය) | | | 11,619,000.08 | (24,574,155.13) |
| 193,835,079.25 | මුළු ස්කන්ධය | | | | 810,609,844.87 |
| | **ජංගම නොවන වගකීම්** | | | | |
| 3,759,834.00 | පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 8 | | 3,996,885.25 | 3,996,885.25 |
| | **ජංගම වගකීම්** | | | | |
| 15,329,044.22 | රඳවාගත් මුදල් | 6 | | 61,389,788.25 | |
| 8,654,620.94 | උපචිත වියදම් | 7 | | 168,128,591.25 | 229,518,379.50 |
| **221,578,578.41** | **මුළු ස්කන්ධය හා වගකීම්** | | | | **1,044,125,109.62** |

අවසන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ වගකීම වේ.

| | | |
|---|---|---|
| ............................ | ............................ | ............................ |
| අධ්‍යක්ෂ (මුදල්) | අධ්‍යක්ෂ ජනරාල් | සභාපති |
| නා.ජ.සං.අ | නා.ජ.සං.අ | නා.ජ.සං.අ |

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

2012 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | | |
|---|---|---|---|
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | | 53,608,000.00 | |
| අඩුකලා: | | | |
| **මෙහෙයුම් කටයුතු සඳහා** | | | |
| පරිපාලන වියදම් | (57,438,713.03) | | |
| අත්තිකාරම් | (190,785.00) | (57,629,498.03) | (4,021,498.03) |
| | | | |
| **ආයෝජන කටයුතු සඳහා ලැබීම්** | 645,734,000.00 | | |
| පොලි ආදායම් | 3,325,672.70 | 649,059,672.70 | |
| අඩුකලා: | | | |
| **ආයෝජන කටයුතු** | | | |
| සංවර්ධන වියදම් | (538,738,941.04) | | |
| ණය නිකුත්කිරීම් | (38,206,912.00) | | |
| ස්ථාවර වත්කම් | (2,412,190.60) | | |
| කොන්ත්‍රාත් අත්තිකාරම් | (74,352,066.63) | (653,710,110.27) | (4,650,437.57) |
| අතිරික්තය/ (ඌනතාවය) | | | (8,671,935.60) |
| | | | |
| 2012.01.01 දිනට මුදල් හා බැංකු ශේෂය | | | 62,517,607.21 |
| 2012.01.01 දිනට මුදල් හා බැංකු ශේෂය | | | 53,845,671.61 |

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 අනුව සෘජු ක්‍රමයට මෙම මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත.

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## අදායම් වියදම් ගිණුම

| 2011 | | සටහන් | | |
|---|---|---|---|---|
| **111,764,387.50** | ආදායම් | | **117,913,032.70** | |
| **1,694,234.46** | වර්ෂයතුල කපා හැරීම් (නා.ජ.ප්‍ර.වැ.) | | 1,694,234.46 | **119,607,267.16** |
| 113,458,621.96 | | | | |
| **122,718,180.68** | **සංවර්ධන වියදම්** | 1 | 39,872,062.10 | |
| **46,570,551.05** | **පරිපාලන වියදම්** | 2 | 61,725,131.45 | |
| **1,446,623.13** | **වෙනත් වියදම්** | 3 | 6,391,073.53 | 107,988,267.08 |
| **(57,276,732.90)** | අතිරික්තය/ (ඌනතාවය) | | | 11,619,000.08 |
| **(57,276,732.90)** | අතිරික්තය/ (ඌනතාවය) | | | **11,619,000.08** |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல / My No. } ඊඑච්/සී/යූඑස්ඩීඒ/ඒබීසීඩී ඊඑෆ්/13/2012/26

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2013 ඔක්තෝබර් 27 දින

සභාපති,
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය , මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී පනතේ 17(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ඉදිරියේදී නිකුත් කරනු ඇත.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම.

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.


අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. } 2887028 /034
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම.

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

---

2.1 තත්ත්වාගණනය කළ මතය.

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

---

2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම.

---

පහතින් දැක්වෙන කරුණු හේතුවෙන්, භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහයක් නොමැතිව අධිකාරිය පවත්වා ගෙන යාමේ අවිනිශ්චිතතාවක් පවතී.

(ඇ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16(3) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව , අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් මිලියන 5000 ක් විය යුතු අතර එය කොටස් වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබියයුතු වුවද 2012 වර්ෂය නිම වන විටත් එලෙස ප්‍රාග්ධනය ගොඩනගා නොතිබුණි.

(ආ) උක්ත පනතේ 16 (ඉ) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව , අඩු වියදම් නිවාස වැඩසටහන්වලට මුදල් සැපයීම් සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කරගනු ලබන සියලු මුදල් ජනාවාස සංවර්ධන අධිකාරියේ අරමුදලට බැර කළ යුතුය. එහෙත් 2010 දෙසැම්බර් 14 දිනැති අංක 10/2951/504/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම සේවා ගාස්තු අයකිරීම නවතා තිබුණු බැවින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට සිය ප්‍රධාන ආදායම් මාර්ගය අහිමි වී තිබුණි.

2.2.2 රියල් එස්ටේට් එක්ස්චේන්ජ් පුද්ගලික සමාගම ඇවරකර වත්කම් හා වගකීම් පවරා ගැනීම.

---------------------------------------------------------------------------------------------

2007 පෙබරවාරි 22 දිනැති අංක අමප/07/0140/226/013 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටවූ වහාම රියල් එස්ටේට් එක්ස්චේන්ජ් පුද්ගලික සමාගම ඇවරකර එම සමාගමේ වත්කම් හා වගකීම්ද , කාර්ය මණ්ඩලයද අධිකාරිය වෙත පවරා ගතයුතු වුවද , 2013 අගෝස්තු 15 දින වන විටද කාර්ය මණ්ඩල අන්තර්ග්‍රහණය පමණක් සිදුකර තිබුණි.

සමාගමේ වත්කම්වලට වඩා වගකීම් වැඩි බැවින් ස්වේච්ඡාවෙන් ගණන් බෙරා වසා දැමීමට නොහැකි බවට නීතිපති උපදෙස්දී ඇති බව සභාපති විසින් මා වෙත දන්වා තිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු.

----------------------

2012 වර්ෂය වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල් වියදම සහ සේවක භාරකාර අරමුදල් වියදම පිළිවෙලින් රු. 1,862,687 ක් සහ රු. 279,418 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.

-------------------------------------

ප්‍රජා සංවිධාන වෙත ගෙවිය යුතුව තිබුණු රු.3,741,000 ක් නොගෙවීමට සමාලෝචිත වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණු නමුත් ගිණුම්වල අවශ්‍ය ගැළපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

වත්කමක් ලෙස හෙළිදරව් කර තිබුණු රු.16,450 ක් වූ බැංකු ශේෂය අධිකාරිය සතු වත්කමක් බව තහවුරුකර නොතිබුණි.

2.2.6 නීති , රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1985 අංක 01 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනතේ 09(2) වගන්තිය | පනතේ විධිවිධානවලට පටහැනිව 2012 වර්ෂය සඳහා රු.1,862,687 ක් අඩුවෙන් සේවක අර්ථසාධක අරමුදල වෙත ප්‍රේෂණය කර තිබුණි. |
| 1993 අංක 18 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් (සංශෝධන) පනතේ 5(1) වගන්තිය | පනතේ විධිවිධානවලට පටහැනිව 2012 වර්ෂය සඳහා රු.279,418 ක් අඩුවෙන් සේවක භාරකාර අරමුදල වෙත ප්‍රේෂණය කර තිබුණි. |
| මුදල් රෙගුලාසි අංක 371(2) (ආ) | මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් කාර්යයක් සඳහා නිකුත් කළ හැකි තත්කාර්ය අතුරු අග්‍රිම උපරිම මුදල් රු.20,000 ක් වුවත් ,එම සීමාව ඉක්මවා අවස්ථා 45 කදී නිලධාරීන් වෙත එකතුව රු.22,054,409 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය.

3.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,619,000 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය වූ රු.57,276,733 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.68,895,733 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. මූල්‍ය ප්‍රතිඵලය වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපෑ හේතු පහතින් දැක්වේ.

| ආදායම් /වියදම් විෂයය. | වාසිදායක/(අවාසිදායක) බලපෑම. |
|---|---|
| | රු. |
| මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන | 4,657,000 |
| වෙනත් ආදායම් | 344,114 |
| පොලී ආදායම් | 1,147,531 |
| සංවර්ධන වියදම් | 82,846,119 |
| පරිපාලන වියදම් | (15,154,580) |
| වෙනත් වියදම් | (4,944,451) |
| | 68,895,733 |

## 4. මෙහෙයුම් සමාලෝචනය.

### 4.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මැටි ගෙවල් සෑදීමේ ව්‍යාපෘතියක ශ්‍රමිකයින්ට වැටුප් ගෙවීම සඳහා නිලධාරින් දෙදෙනෙකු වෙත නිකුත් කර තිබුණු අත්තිකාරම් එකතුව රු.2,416,900 ක් ඔවුන්ගේ පෞද්ගලික බැංකු ගිණුම්වල තැන්පත් කර තිබුණු අතර ඇස්තමේන්තුගත දෛනික වැටුප් රේටයන් ඉක්මවමින් සහ ශ්‍රමිකයින් නොපැමිණි දින පැමිණි දින ලෙස සළකමින් රු.150,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) විසිරි නිවාස ආධාර වැඩ සටහන යටතේ ඉදිකිරීම් අවසන් කළ ප්‍රතිලාභීන් ඇගයීම සඳහා බෙදාදීමේ අරමුණින් මිලදී ගෙන තිබුණු නමුත් එකී අරමුණට පරිභාහිරව කටයුතු කරමින් රු.103,320 ක් වටිනාකම වූ ඔරලෝසු 164 ක් වෙනත් විවිධ පාර්ශව වෙත බෙදාදී තිබුණි.

(ඇ) කාර්ය මණ්ඩලය ඇගයීම හා පුහුණු වැඩ සටහනක් හඳුන්වා දෙමින්,අධිකාරියේ සමස්ථ කාර්ය මණ්ඩලය සහ අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ ඇති සියළුම සංස්ථාවල මාණ්ඩලික ශ්‍රේණිවල සියළුම නිලධාරීන් ඇතුළත්ව මුළු සංඛ්‍යාව 180 කට සමාලෝචිත වර්ෂයේ එක් දිනක සංග්‍රහ වියදම් වෙනුවෙන් රු.493,490 ක් වැය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සංග්‍රහ වියදම් සඳහා අධිකාර බලය ලබාගත් බවට තොරතුරු විගණනයට ඉදිරිපත්කර නොතිබුණු අතර විධිමත් පරිදි ප්‍රතිපාදන ලබාගෙනද නොතිබුණි.

(ii) සංග්‍රහය පැවැත්වීමේ අරමුණ සහ එයට සහභාගීවූවන්ගේ පැමිණීමේ ලේඛනය වැනි තහවුරු කිරීමේ සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

(iii) ඉන්වොයිසිය පදනම් කර ගෙන මුදල් ගෙවනවා වෙනුවට ඉදිරිපත් කර තිබුණු මිල කියවුමක් පදනම් කර ගනිමින් මුදල් ගෙවා තිබුණු අතර ගෙවීම සඳහා ලදුපතක්ද ලබාගෙන නොතිබුණි.

(ඈ) ලෝක ජනාවාස දින වැඩසටහනේ ප්‍රචාරක කටයුතු වෙනුවෙන් බැනර්, ටීෂර්ට්, තොරන් සහ ප්‍රදර්ශන පුවරු සැපයීම සහ සැරසිලි කටයුතු කිරීම සඳහා රු.639,300 ක් පෞද්ගලික ප්‍රචාරක සමාගමකට ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මිල විමසුම් විධිමත් පරිදි භාරදී නොතිබුණු අතර, මිල කියුම් ප්‍රසම්පාදන කමිටුව ඉදිරියේ විවෘතකර නොතිබුණි. ඒවා දින දෙකකදී විවෘතකර තිබුණු අතර විවෘත කළ නිලධාරීන්ගේ අත්සන් තබා නොතිබුණි.

(ii) අදාළ ද්‍රව්‍ය සැපයීම හා සැරසිලි කටයුතු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීමට ප්‍රථම , එම ද්‍රව්‍ය නිසි ප්‍රමිතියට අනුකූලව සපයා තිබුණු බව හා අදාළ සවිකිරීම් නිසි පරිදි සිදුකර තිබුණු බව තහවුරු කර ගැනීම සඳහා ද්‍රව්‍ය ලැබීම් සහ නිකුත් කිරීම් පිළිබඳ ලිඛිත සාක්ෂි හෝ අදාළ කාර්යය සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ගේ නිර්දේශ හෝ ලබා ගෙන නොතිබුණි.

(iii) සවිකරන ලද තොරන්, බැනර් යනාදිය ආපසු ගබඩාවට භාර ගෙන නොතිබුණි.

4.2 කාර්ය මණ්ඩල පරිපාලනය.

-----------------------------

අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවාගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව 06 ක් වූ අතර කාර්ය මණ්ඩල ඌනතාවය 16 ක් විය. ස්ථිර පදනම මත බඳවා ගැනීමට හැකියාව තිබියදී කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු සේවක සංඛ්‍යාව 19 ක් විය.

4.3 වාහන උපයෝජනය.

------------------------

සමාලෝචිත වර්ෂය තුළදී කුලී පදනම මත ලබා ගෙන තිබුණු වාහන 06 ක් සඳහා ගෙවා තිබුණු මුළු මුදල රු. 7,067,405 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආර්ථික වශයෙන් වඩාත් වාසිදායක සැපයුම්කරුවකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කර නොතිබුණි.

(ආ) වාහන සැපයුම්කරු සමඟ ඇතිකරගෙන තිබුණු ගිවිසුමේ 7 හා 8 වගන්තිවල දැක්වෙන විධිවිධානවලට පටහැනිව, 2012 පෙබරවාරි මාසය තුළදී වාහන 05 ක ධාවනය කර තිබුණු මුළු දුර කිලෝමීටර් 17,849 ක් වෙනුවෙන් රු.68,893 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) සැපයුම්කරුවන්ගේ ඉල්ලීම් මත 2012 මාර්තු මාසයේ සිට ධාවනය කරනු ලබන සෑම කිලෝ මීටරයක් සඳහාම රු.35 බැගින් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණු නමුත් එම අවස්ථාවේදී හෝ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කර නොතිබුණි.

(ඈ) 2012 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 8 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව, කුලී පදනම මත සපයා ගෙන තිබුණු වාහනවලින් එකක් ඉවත්කිරීමේ පදනම මත මහා භාණ්ඩාගාරයෙන් 2012 පෙබරවාරි මාසයේ දී වාහනයක් ලබාදී තිබුණු නමුත් කුලී පදනම මත සපයා ගෙන තිබුණු කිසිදු වාහනයක් ඉවත් කර නොතිබුණි. ඒ වෙනුවට අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු වාහනය ආපසු භාරදී තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය.

----------------------------------------

5.1 ක්‍රියාකාරී සැලැස්ම.

--------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය නිසි පරිදි සමාලෝචනය කළ හැකිවන පරිදි ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි. ව්‍යාපෘති 06 ක් සම්බන්ධයෙන් 2012 දෙසැම්බර් 31 දින වන විට අත්පත් කර ගැනීමට අපේක්ෂා කර තිබුණු මූල්‍ය ඉලක්කය රු.1,413,980,000 ක් වුවද, එදිනට මූල්‍ය ප්‍රගතිය රු.998,540,000 ක් පමණක් වූයෙන් මූල්‍ය ප්‍රගතියෙහි පසුබෑම සියයට 30 ක්වී තිබුණු අතර ඊට සමාන ප්‍රමාණයකින් භෞතික ප්‍රගතියද පසුබෑමකට ලක්වී තිබුණි. ප්‍රමාණවත් පරිදි අග්‍රිම මුදල් නොලැබීම මෙයට හේතුවී තිබුණි.

5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම.

---------------------------------

අධිකාරිය ආරම්භකර තිබුණු 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ වර්ෂ වලට අදාළ වාර්ෂික වාර්තා 2013 ඔක්තෝබර් වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

6. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) ගිණුම්කරණය.

(ආ) වියදම් කළමනාකරණය.

(ඇ) මානව සම්පත් කළමනාකරණය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න,

වැඩබලන විගණකාධිපති.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

2012.12.31 දිනට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදිවේ.

| | |
|---|---|
| නීතිඥ පාලිත ගමගේ මහතා | - සභාපති |
| පූජ්‍ය ඉත්තෑකන්දේ සද්ධාතිස්ස හිමි | - අධ්‍යක්ෂ |
| ඩබ්.එම්.ජී. වික්‍රමසිංහ මහතා | - අධ්‍යක්ෂ |
| නිමල් පෙරේරා මහතා | - අධ්‍යක්ෂ |
| ඒ.ඩබ්. දයානන්ද මහතා | - අධ්‍යක්ෂ |
| එම්.අයි.වී.අමරසේකර මෙනවිය | - අධ්‍යක්ෂ |
| බර්නාඩ් කාරියවසම් මහතා | - අධ්‍යක්ෂ |
| රනිල් ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා | - අධ්‍යක්ෂ |
| ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා | - අධ්‍යක්ෂ |
| චමින්ද කුමාර සුදසිංහ මහතා | - අධ්‍යක්ෂ |
| අජිත් කිත්සිරි බණ්ඩාර මහතා | - අධ්‍යක්ෂ |

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක් ලෙස ක්‍රියාත්මක වන විගණන සහ කළමනාකරණ කමිටුව 2012 වර්ෂය තුළදී රැස්වීම් 04 ක් පවත්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් වන පහත නම් සඳහන් අධ්‍යක්ෂවරුන් විගණන සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් ලෙස කටයුතු කරති.

එම්.අයි.වී.අමරසේකර මෙනවිය – සභාපති<br>
බර්නාඩ් කාරියවසම් මහතා<br>
රනිල් ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා<br>
ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා<br>
චමින්ද කුමාර සුදසිංහ මහතා

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් අඩු පහසුකම් සහිත නාගරික ජනාවාස වල පදිංචි ජනතාවට නිවාස විසඳුම් සපයාදෙන අතර නාගරික ප්‍රදේශවල පිහිටා ඇති ජිවත්වීමට සුදුසු තත්ත්වයේ නැති නිවාස සමූහ උසස් තත්ත්වයකට ගෙනඒමට කටයුතු කරයි. ඒ හා සමගාමීව නාගරික ජනාවාස වල ජිවත්වෙන ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වය සංවර්ධනය කිරීම පිණිස මානව සංවර්ධන වැඩසටහනක් ද ක්‍රියාත්මකකර ඇත.

1971 අංක 38 දරණ මුදල් පනතෙහි 12 වැනි සහ 13.6 වැනි වගන්ති ප්‍රකාරව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලබන සියලුම ගනුදෙනු නිසිපරිදි ගිණුම් ගත කර ගිණුම්පොත් පවත්වාගෙනයාම සහතිකකිරීමේ වගකීම සහ අධිකාරියේ ගිණුම්කටයුතු වල සහ අදාළ වර්ෂය සඳහා අතිරික්තයේ / ඌණතාවයේ සත්‍ය සහ සාධාරණ මතයක් සපයාදෙන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ වගකීම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි.

ඒ අනුව, නිසි පරිදි ගිණුම් පොත් පවත්වාගෙන යන ලෙසටත්, නිතිපතා පවත්වනු ලබන රැස්වීම්වලදී සහ විගණන කමිටුව හරහා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය සමාලෝචනව කරන ලෙසටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරිය වෙත නියෝග කර ඇත.

මෙම පොත්පිංචෙහි ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, සෑම අවස්ථාවකටම අදාල වන පරිදි නිසි ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගත කර ගැනීමත්, සාධාරණ සහ විචක්ෂණ විනිශ්චයන් සහ ඇස්තමේන්තු මඟින් තහවුරුකිරීමත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සළකාබලා ඇත.

අධිකාරිය සතු වත්කම් ආරක්ෂ කිරීමටත්, වංචා සහ අනෙකුත් අක්‍රමිකතා සොයා ගැනීමට සහ ඒවා වලක්වා ගැනීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ට ප්‍රායෝගිකව ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරියේ වත්කම් ආරක්ෂාකර ගැනීමට සහ එහි වාර්තාවන් හි නිරවද්‍යතාවය සහ විශ්වාසනීයත්වය ප්‍රායෝගිකව හැකිතාක්දුරට ආරක්ෂාකර ගැනීමට හැකිවන පරිදි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සේවාවන් ක්‍රමානුකූල ආකාරයකට ඉටුකිරීමට අවශ්‍යකරන, අභ්‍යන්තර විගණන සහ මූල්‍ය හා අනෙකුත් පාලනවලින් සමන්විත ඵලදායි සහ පරිපූර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපනයකර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

.........................................

වෛද්‍ය සුමිත් වන්නිආරච්චි<br>
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

මනා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයක් පවතින බව සහතික කිරීම සඳහා කළමණාකරණයට සහ අදාළ බලධාරීන්ට නිවැරදි, යෝග්‍ය සහ කාලීන වූ තොරතුරු සපයා දීමට හැකි වන පරිදි එය හොඳින් කළමණාකරණය කෙරෙන බව සහතික කිරීම සඳහාත්, නීති සහ අධිකාරියේ ප්‍රතිපත්ති වලට සහ ව්‍යවස්ථාපිත හා සංස්ථාපිත පාලනයන්ට අනුකූල වන පරිදි ගිණුම්කරණ සහ අභ්‍යන්තර පාලන කළමණාකරණය කිරීම සඳහාත්, සමාලෝචනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ බලතල විගණන කමිටුවට පැවරී තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත සහ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් 04 දෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත විය. පෙර සිට පැවති පරිචයට අනුව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (මුදල්) සහ අනෙකුත් අධ්‍යක්ෂවරුන් කිහිප දෙනෙකු ද කමිටු සාමාජිකයින් ලෙස සේවය කරන ලදී. රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත, සහකාර අධ්‍යක්ෂ - රාජ්‍ය ව්‍යවසාය, එම්.අයි.වී. අමරසේකර මෙනවිය 2012 වර්ෂයේ කමිටු සභාපති ලෙස කටයුතු කළාය. බර්නාඩ් කාරියවසම්, රනිල් ප්‍රියන්ත ප්‍රනාන්දු, ඒ.එස්. සුරේෂ් ඉන්දික සහ චමින්ද කුමාර සුදසිංහ යන මහත්වරු කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කළහ.

රජයේ විගණන අධිකාරී නිරීක්ෂකයෙකු ලෙස විගණන රැස්වීම්වලට සහභාගී වූ අතර අවශ්‍ය පරිදි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අනෙකුත් නිලධාරීන් ගණනාවක් රැස්වීම් වලට සහභාගී විය. අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කමිටුවේ ලේකම් ලෙස කටයුතු කළේය. අභ්‍යන්තර විගණක විසින් සකස් කරන ලද, 2012 වර්ෂය සඳහා වූ විස්තීර්ණ විගණන වැඩසටහන කමිටුව විසින් සලකා බලා අනුමත කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ කමිටුව රැස්වීම් වාර 4ක් පවත්වා ඇත. විගණන වාර්තා, විගණන විමසුම් වලට අදාළ ගැටළු සහ පිළිතුරු, අභ්‍යන්තර සහ බාහිර විගණනයන්හී නිරීක්ෂණ, අභ්‍යන්තර පාලන පද්ධතීන් මෙන්ම වාර්ෂික වාර්තාව නිසි කලට සකස් කර ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීමද ඇතුළත්ව වැඩිදියුණු කිරීම් අවශ්‍ය අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳව කමිටුව සාකච්ඡා කරන ලදී. අවශ්‍ය නිවරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ගනු ලැබූ තීරණ වලට අදාළ පසුවිපරම් ක්‍රියාමාර්ග ද සාකච්ඡා කරන ලදී. සාකච්ඡා කරන ලද ප්‍රමුඛ කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන ලදී.

සාමාජිකයින් සහ නිලධාරීන් විසින් ලබා දුන් වටිනා දායකත්වය මෙන්ම විශේෂයෙන්ම විගණන ක්‍රියාවලියේදී විගණනකාධිපති විසින් ලබා දුන් ඉතා වටිනා නිරීක්ෂණයන් ද මම අවංකවම ඉතා අගය කොට සලකමි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

..............................................

වෛද්‍ය සුමිත් වන්නිආරච්චි
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්